සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

බෞද්ධ ශිෂ්ටාචාරය I
பௌத்த நாகரிகம் I
Buddhist Civilization I

45 S I

2019.08.05 / 0830 - 1030

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** උත්තරය තෝරාගෙන එය **උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** බුද්ධකාලීන භාරතයේ පැවැති ආගම් හා දර්ශන අතුරෙන් වෛදික ආගම වෙන්කර හඳුනා ගැනීමට වඩාත් උචිත ප්‍රකාශය කුමක් ද?
(1) ඊශ්වර නිර්මාණවාදය හා නියති පරිණාමවාදය පිළිගැනීම
(2) යාගය හා නියති පරිණාමවාදය පිළිගැනීම
(3) ඊශ්වර නිර්මාණවාදය හා සංසාරශුද්ධිවාදය පිළිගැනීම
(4) නියති පරිණාමවාදය හා කර්ම මාර්ගය පිළිගැනීම
(5) කර්ම මාර්ගය හා ඊශ්වර නිර්මාණවාදය පිළිගැනීම

**2.** 'යාගය' පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි **නො වන්නේ**, කුමන ප්‍රකාශය ද?
(1) 'උද්ගාතෘ' යනු යාගයට ආරාධනා කරන්නා වේ.
(2) බ්‍රහ්මසහව්‍යතාව සඳහා එක ම මාර්ගය යාගයයි.
(3) වේද ග්‍රන්ථයන්හි යාගය ගැන තොරතුරු දැක්වේ.
(4) යාගයක් සාර්ථක කර ගැනීම සඳහා බ්‍රාහ්මණ පූජකවරුන්ගේ සහභාගිත්වය අනිවාර්ය වේ.
(5) යාගය ඉහළ වර්ණවලට පමණක් සීමා වූ පූජා චාරිත්‍රයකි.

**3.** සත්ත්වයාගේ මරණින් මතු පැවැත්ම, පරලොව, කුශලා'කුශල කර්මයන්ගේ ඵල විපාක ආදිය පිළිබඳ විමසන ලදු ව බුද්ධකාලීන ඇතැම් ශ්‍රමණයන් නිශ්චිත පිළිතුරක් නො දුන් බව සංජය බෙල්ලට්ඨිපුත්තගේ ඉගැන්වීම්වලින් පැහැදිලි වේ. එසේ පිළිතුරු නො දීමට හේතු වන සාධක හතරක් බුදුසමය පෙන්වා දී ඇත. එම හේතු හතරට අයත් **නො වන** ප්‍රකාශය තෝරන්න.
(1) උපාදානයට ඇති බිය හා පිළිකුල නිසා පිළිතුරු නො දීම
(2) සංසාරයට ඇති බිය හා පිළිකුල නිසා පිළිතුරු නො දීම
(3) මුසාවක් සිදුවෙයැ'යි මුසාවට ඇති බිය හා පිළිකුල නිසා පිළිතුරු නො දීම
(4) පිළිතුරු දෙනු ලබන කල්හි ප්‍රතිප්‍රශ්න විචාරනු ලබති'යි ඇති බිය නිසා පිළිතුරු නො දීම
(5) නුවණ මඳ බැවින්, බෙහෙවින් මෝඩ බැවින් හා ප්‍රශ්නවලට පිළිතුරු දීමේ ශක්තියක් නැති බැවින් පිළිතුරු නො දීම

**4.** බුද්ධකාලීන ප්‍රකට ශාස්තෘවරයකු වූ මක්ඛලීගෝසාලතුමන්ගේ ප්‍රධාන ඉගැන්වීම වූයේ,
(1) උච්ඡේද භෞතිකවාදයයි.
(2) පරම අවිහිංසාවාදයයි.
(3) අමරා වික්ඛෙපවාදයයි.
(4) අකිරියවාදයයි.
(5) නියති පරිණාමවාදයයි.

**5.** බුද්ධකාලීන භාරතයේ පැවැති සොළොස් මහා ජනපද අතුරෙන් විශාලතම නියෝජිත මන්ත්‍රී මණ්ඩලයකින් පාලනය කරනු ලැබූ ජනපදය ලෙස සැලකෙන්නේ,
(1) මගධ ජනපදයයි.
(2) කොසොල් ජනපදයයි.
(3) වජ්ජි ජනපදයයි.
(4) මල්ල ජනපදයයි.
(5) කුරු ජනපදයයි.

[දෙවැනි පිටුව බලන්න.

EXAMMOOD.LK

6. කෘෂි ආර්ථිකයට මුල්තැනක් දුන් පැරණි භාරතයේ, ජාත්‍යන්තර වශයෙන් වාණිජ්‍යකරණය දියුණු තත්ත්වයකට පත්ව තිබුණු බවට දැක්විය හැකි වඩාත් සුදුසු සාධකය වන්නේ
   (1) සේද මාර්ගය ඔස්සේ සිදු වූ වෙළඳාමයි.
   (2) නව නගර නිර්මාණය වීමයි.
   (3) භාණ්ඩ නිෂ්පාදනය ඉහළ යාමයි.
   (4) ගංගාවන් ඔස්සේ භාණ්ඩ ප්‍රවාහනය කිරීමයි.
   (5) කෘෂි නිෂ්පාදනවලින් ස්වයංපෝෂණය වීමයි.

7. බුදුරජාණන් වහන්සේ ශාස්වත-අශාස්වත යන අන්තද්වයට නො පැමිණ සුන්දර වූ නිවනට ගිය බැවින් ද, සුදුසු තැන සුදුසු වචන යහපත් ව කියන බැවින් ද සුවිශේෂ නාමයකින් හඳුන්වන බව නව අරහාදි බුදුගුණ විවරණයෙන් පැහැදිලි වේ. එම බුදුගුණය හැඳින්වෙන්නේ,
   (1) ලෝකවිදූ නමිනි.
   (2) අරහං නමිනි.
   (3) සුගත නමිනි.
   (4) සම්මාසම්බුද්ධ නමිනි.
   (5) භගවා නමිනි.

8. "බුදුරජාණන් වහන්සේ වනාහි උන්වහන්සේ විසින් දේශනා කරන ලද සියලු ම ගුණධර්මයන්ගේ ප්‍රතිමූර්තියයි. හතළිස් පස් වසරක කාලය තුළ දී තමන් විසින් ප්‍රකාශ කරන ලද වචන උන්වහන්සේ ක්‍රියාවට නැගූහ. කිසිදු දුබලතාවක් හෝ පහත් හැඟීමක් හෝ උන්වහන්සේගෙන් කිසිවිටෙකත් දෘශ්‍යමාන නො වීය. ලෝකයට ඉතාම පරිපූර්ණ ආචාරධර්ම පද්ධතියක් ඉදිරිපත් කරන ලද්දේ බුදුරජාණන් වහන්සේ විසිනි." බුදුරජාණන් වහන්සේ පිළිබඳ නූතන ඇගයීමක් වන මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
   (1) මහාචාර්ය ලක්ෂ්මී නරසු
   (2) ඇල්බට් අයින්ස්ටයින්
   (3) බර්ට්‍රන්ඩ් රසල්
   (4) මහාචාර්ය මැක්ස් මුලර්
   (5) එඩ්වින් ආර්නෝල්ඩ්

9. ප්‍රථම සංගායනාව අවසානයේ දී විනය පිටකයත්, සූත්‍ර පිටකයේ නිකාය පහත් කටපාඩමින් පවත්වා ගෙන යාමට මහතෙරවරුන් හා උන්වහන්සේලාගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරා වෙත භාර කරන ලද බව ශාසන ඉතිහාසයේ සඳහන් වේ. එහි ලා දීඝනිකායට අයත් සූත්‍ර මුඛ පරම්පරාවෙන් පවත්වා ගෙන යාමට භාර කරන ලද්දේ,
   (1) සැරියුත් හිමියන්ගේ ශිෂ්‍ය පරම්පරාවටයි.
   (2) උපාලි හිමියන් ප්‍රමුඛ ශිෂ්‍ය පරම්පරාවටයි.
   (3) මහාකාශ්‍යප හිමියන් ප්‍රමුඛ ශිෂ්‍ය පරම්පරාවටයි.
   (4) අනුරුද්ධ හිමියන් ප්‍රමුඛ ශිෂ්‍ය පරම්පරාවටයි.
   (5) ආනන්ද හිමියන් ප්‍රමුඛ ශිෂ්‍ය පරම්පරාවටයි.

10. බුද්ධකාලීන භික්ෂුණී ශාසනයේ ප්‍රකට භික්ෂුණියක වූ ඛේමා රහත් තෙරණින් වහන්සේට පිරිනැමූ අගතනතුර කුමක් ද?
   (1) චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර අගතනතුර
   (2) ප්‍රඥාසම්පන්න භික්ෂුණීන් අතර අගතනතුර
   (3) සුමධුර ලෙස දහම් දෙසන භික්ෂුණීන් අතර අගතනතුර
   (4) ශික්ෂාකාමී භික්ෂුණීන් අතර අගතනතුර
   (5) ප්‍රාතිහාර්ය පෑමෙහි දක්ෂ භික්ෂුණීන් අතර අගතනතුර

11. විවාහ පත්වන යුවතිපති දෙදෙනා තුළ ම ගුණධර්ම සතරක් සමාන ව පිහිටි කල්හි සාර්ථක යුගදිවියක් නිර්මාණය වන බව නකුල මාතා-නකුල පිතා යුවලගේ පරමාදර්ශී විවාහ ජීවිතයෙන් පැහැදිලි වේ. සමජීවී සූත්‍රයේ දැක්වෙන එම ගුණධර්ම හතර මොනවා ද?
   (1) සද්ධා, සීල, විරිය, බල
   (2) සද්ධා, සීල, විරිය, පීති
   (3) සද්ධා, සීල, හිරි, ඔත්තප්ප
   (4) සද්ධා, සීල, චාග, පඤ්ඤා
   (5) සද්ධා, සීල, විරිය, පඤ්ඤා

12. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් පුද්ගල ස්වාමිත්වය පැහැදිලි කිරීමට වඩාත් සුදුසු ප්‍රකාශය කුමක් ද?
   (1) තමා හිසට තම අතම ය සෙවනැල්ල.
   (2) කළ කළ දේ පල පල දේ.
   (3) තමා උපමා කොට අනුන්ට හිංසා නො කළ යුතු ය.
   (4) පටිච්චසමුප්පන්න ව සියල්ල සිදු වේ.
   (5) පිං කරන්නා දෙලොවෙහි ම සතුටු වේ.

13. රාජ්‍යයේ ප්‍රභවය පිළිබඳ අග්ගඤ්ඤ සූත්‍රාගත ඉගැන්වීමට අනුව පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **වැරදි** ප්‍රකාශය කුමක් ද?
   (1) වැරදිකරුවන්ට දඬුවම් දීම පාලකයාගේ ප්‍රධාන කාර්යයයි.
   (2) පාලකයාට බදු ගෙවීමට ජනතාව බැඳී සිටිති.
   (3) පාලකයා 'රාජා' නාමයෙන් හඳුන්වන්නේ මහජනයාගේ කැමැත්තෙන් පත්කර ගත් බැවිනි.
   (4) පාලකයා වෙත ඇති බලය ජනතාව විසින් ලබා දෙන ලද්දකි.
   (5) සමාජගත දුරාචාර බහුල වීම නිසා පාලකයෙක් පත්කර ගන්නා ලදි.

[තුන්වැනි පිටුව බලන්න.

EXAMMOOD.LK EXAMMOOD.LK

**14.** බෞද්ධ දේශපාලන දර්ශනය අනුව පාලන තන්ත්‍රයක් යනු සමාජ සුභසාධනය හා ජනතා ශුභසිද්ධිය උදෙසා ම ඇප කැප වූ සංස්ථාවකි. එහි ලා සමස්ත ජනතාවට සමාන ආකල්පයකින් කටයුතු කළ යුතු ය. එනම් යම් යම් අය පිළිබඳ ව පක්ෂග්‍රාහී ව කටයුතු කිරීමෙන් වැළකිය යුතු ය. එසේ අපක්ෂපාතී ව කටයුතු කිරීමට වඩාත් ම අනුබල දෙන බෞද්ධ දේශපාලන මූලධර්මය වන්නේ,
(1) සතර අගතියෙන් වෙන් ව කටයුතු කිරීමයි.
(2) පංචසීල ප්‍රතිපදාව අනුව කටයුතු කිරීමයි.
(3) දසරාජ ධර්ම අනුව රාජ්‍යය මෙහෙයවීමයි.
(4) සප්ත අපරිහානීය ධර්ම ප්‍රගුණ කිරීමයි.
(5) දස සක්විතිවත් අනුගමනය කිරීමයි.

**15.** අපරාධ මර්දනයෙහි ලා දඬුවම ප්‍රමාණවත් නො වන බවත් ජනතාව සදාචාරවත් කිරීම මෙන් ම ආර්ථික ක්ෂේත්‍රයේ වෙනස්වීම් සිදු කොට ආර්ථික වශයෙන් සවිබල ගැන්විය යුතු බවත් බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම පිළිබඳ විමසිලිමත් වීමෙන් පැහැදිලි වේ. රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අතර මෙම අදහස ඇතුළත් වනුයේ,
(1) දස රාජ ධර්මවල ය.
(2) දස සක්විතිවත්වල ය.
(3) සප්ත අපරිහානීය ධර්මවල ය.
(4) කූටදන්ත සූත්‍රාගත රාජ්‍ය පාලන මූලධර්මවල ය.
(5) සතර අගතියෙන් වෙන් ව කටයුතු කිරීමේ මූලධර්මයෙහි ය.

**16.** පුඤ්ඤ-පාප, කුසල-අකුසල, සාධු-අසාධු, කරණීය-අකරණීය ආදි පුද්ගලයාගේ සචේතනික ක්‍රියා විනිශ්චයෙහි ලා අම්බලට්ඨිකරාහුලෝවාද සූත්‍රයෙන් ප්‍රකට වන නිර්ණායකය කුමක් ද?
(1) ලෝභ, දෝස, මෝහ චේතනා මුල්කොටගත් ක්‍රියා අකුසල කර්ම වන අතර අලෝභ, අදෝස, අමෝහ සහගත ක්‍රියා කුසල කර්ම වේ.
(2) යම් ක්‍රියාවක විපාකය පසුතැවීමට හේතු වේ නම් අකුසල ක්‍රියා වන අතර යම් ක්‍රියාවක විපාකය පසුතැවීමට හේතු නො වේ නම් කුසල ක්‍රියා වේ.
(3) තමා උපමා කොට අනුන් නො නැසිය යුතු ය.
(4) තමා, ලෝකය හා ධර්මය අධිපති කොට සිතා හොඳ-නරක තීරණය කළ යුතු ය.
(5) තමාට, මෙරමාට හා උභය පක්ෂයට අයහපත් වන ක්‍රියා නරක ක්‍රියා ලෙසත්, යහපත් වන ක්‍රියා හොඳ ක්‍රියා ලෙසත් තීරණය කළ යුතු ය.

**17.** දස පිං කිරියවත්හි එන ගරු බුහුමන් කිරීම .............................. යනුවෙන් හැඳින්වේ.
(1) වෙය්‍යාවච්ච (2) අපචායන (3) පත්තිදාන
(4) උපට්ඨාන (5) පත්තානුමෝදනා

**18.** දස අකුසලයන්හි එන 'අභිජ්ඣා' හෙවත් 'අභිද්‍යා' යන්නෙන් අදහස් කරන්නේ,
(1) අවිද්‍යාවයි. (2) ක්‍රෝධයයි. (3) දැඩි ලෝභයයි.
(4) ලජ්ජා නැතිකමයි. (5) කුසීතකමයි.

**19.** පරිසර සංරක්ෂණයෙහි ලා බුදුසමයේ අවධානය කෙතෙක් ද යන්න සූත්‍ර පිටකයේ මෙන් ම විනය පිටකයේ ද එන විවිධ තොරතුරුවලින් පැහැදිලි ය. රුක් රෝපණය, උද්‍යාන නිර්මාණය, ඒ දඬු පාලම් සෑදීම, පැන්හල්, පැන් පොකුණු නිර්මාණය, දිවා රෑ පිං වැඩෙන පිංකම් ලෙස දක්වා තිබීම මෙයට කදිම නිදසුනක් වන අතර එම දේශනාව ඇතුළත් වන්නේ,
(1) සිංසපා සූත්‍රයේ ය. (2) මහාපරිනිබ්බාණ සූත්‍රයේ ය.
(3) වනරෝප සූත්‍රයේ ය. (4) මෙත්ත සූත්‍රයේ ය.
(5) අරියපරියෙසන සූත්‍රයේ ය.

**20.** ධනෝපායනය හා ආර්ථික සුරක්ෂිතතාව තෘප්තිමත් ගෘහස්ථ ජීවිතයකට අත්‍යවශ්‍ය සාධකයකි. දැහැමි ව උපයාගත් ධනය පරිහරණයේදී බුදුසමය පරිභෝජන දර්ශනයක් හඳුන්වා දී තිබේ. එම පරිභෝජන දර්ශනයට අයත් **නො වන** කරුණ කුමක් ද?
(1) අගථිතො (2) අමුච්ඡිතො
(3) අනජ්ඣාපන්නෝ (4) ආදීනවදස්සාවී
(5) සතිමතො

**21.** ධනය ඉපයීමෙහි ලා සැමවිට ම දැහැමි විය යුතු බවත් සාහසික නො විය යුතු බවත් බුදුසමය අවධාරණය කරයි. අල්ලස, දූෂණය, වංචාව, නො දැහැමි වෙළඳාම ආදි අධාර්මික ක්‍රම මෙහි ලා භාවිත නො කළ යුතු ය. ඒ අනුව ධනය ඉපයීමෙහි ලා භාවිත විවිධ නො දැහැමි ක්‍රම අතර 'උක්කෝටන' යනුවෙන් අදහස් කරන්නේ,
(1) හොරට මැනීමයි. (2) හොරට කිරීමයි. (3) අල්ලස් ගැනීමයි.
(4) මං පැහැරීමයි. (5) වංචා කිරීමයි.



EXAMMOOD.LK

**22.** දරිද්‍රතාව වනාහි කාමභෝගී ගිහියාට දුකක් බව උගන්වන බුදුසමය, ආර්ථික සමෘද්ධිය ගෘහස්ථ ජීවිතයට අත්‍යවශ්‍ය සාධකයක් ලෙස අවධාරණය කරයි. මෙම ආර්ථික සමෘද්ධිය පැහැදිලි කිරීමට වඩාත් ම සුදුසු පාරිභාෂික යෙදුම වන්නේ,

(1) උට්ඨාන සම්පදාවයි. (2) සමජීවිකතාවයි. (3) භෝග සුඛයයි.
(4) අත්ථි සුඛයයි. (5) අනණ සුඛයයි.

**23.** බුදුසමය, පඤ්චබලි සංකල්පයෙන් පැහැදිලි කරනුයේ,

(1) ධනෝපායනය පිළිබඳ ක්‍රමවේදයකි. (2) ධන සංරක්ෂණය පිළිබඳ ක්‍රමවේදයකි.
(3) ධන පරිභෝජනය පිළිබඳ විධි නියමයකි. (4) ධන පරිහානිය පිළිබඳ ඉගැන්වීමකි.
(5) ධන ආයෝජනය පිළිබඳ නිර්දේශයකි.

**24.** ආර්ය විනයෙහි බටහිර දිශාවට නමස්කාර කිරීම යනුවෙන් හඳුන්වා ඇත්තේ ......................... විෂයයෙහි යුතුකම් හා වගකීම් ඉටු කිරීමයි.

(1) දෙමාපියන් (2) අඹු-දරුවන් (3) යහළු මිත්‍රයන්
(4) ගුරුවරුන් (5) සේවක-සේවිකාවන්

**25.** තරුණවිය ඉක්ම වූ පුරුෂයකු නව යොවුන් තරුණියක ආවාහකර ගැනීම මූලාශ්‍රයාගත විග්‍රහය අනුව

(1) භෝග විනාශ වීමට හේතුවකි. (2) නිදි වර්ජිත ව සිටීමට හේතුවකි.
(3) පසුතැවීමට හේතුවකි. (4) තෘෂ්ණාව වැඩිවීමට හේතුවකි.
(5) පිරිහීමට හේතුවකි.

**26.** "අඥ බාලයන් ඇසුරු නො කිරීමෙන් යහපතක් ම සිදුවන බව හොඳින් ම දැන සිටි ධම්මික උපාසකතුමා සිල්වත් ගුණවත් පණ්ඩිත ජනයාගේ ඇසුර ම ප්‍රිය කෙළේ ය. සමාජයේ ගරු කටයුතු උතුමන්ට ඉහළින් ම පුදසත්කාර කළ හෙතෙම පූර්වකෘත පුණ්‍ය මහිමයෙන් ද, මනාකොට පිහිටුවා ගත් සිතින් එනම් යහපත් ප්‍රාර්ථනා ඇති සිතින් ද යුක්තව සත්පුරුෂ මිනිසුන් වසන උපද්‍රව රහිත පෙදෙසක වාසය කිරීමට වාසනාවන්ත වූයේ ය." මංගල සූත්‍රයට අනුව මෙම ප්‍රකාශනයෙහි ඇතුළත් මංගල කරුණු ගණන

(1) හතරකි. (2) පහකි. (3) හයකි. (4) හතකි. (5) අටකි.

**27.** "සුකරානි අසාධූනි - අත්තනො අහිතානි ච
යං වෙ හිතං ච සාධුං ච - තං වෙ පරම දුක්කරං"

ඉහත ගාථාවට අනුව ඒකාන්තයෙන් සිදු කිරීමට ඉතා දුෂ්කර කාර්යය වනුයේ,

(1) මනුෂ්‍යාත්මභාවයක් ලබා ගැනීමයි.
(2) බුද්ධෝත්පාද කාලයක උපත ලැබීමයි.
(3) සද්ධර්ම ශ්‍රවණයයි.
(4) තමාට හිත හෝ යහපත පිණිස හේතුවන දේ කිරීමයි.
(5) අනුන්ට හිත හෝ යහපත පිණිස හේතුවන දේ කිරීමයි.

**28.** ප්‍රථම රහත් හැටනම අමතා මුල මැද අග යහපත් වූ ද අර්ථ සහිත වූ ද පරිපූර්ණ වූ ද බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කරන්නැ'යි නියම කළ බුදුරජාණන් වහන්සේ උරුවෙල් දනව්වට වැඩම කොට දහම් දෙසූ බව බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වේ. එහි ප්‍රතිඵලය වූයේ,

(1) යසකුල පුත්‍ර බුදුසමය වැළඳ ගැනීමයි.
(2) භද්දවග්ගිය කුමාරවරුන් බුදුසමය වැළඳ ගැනීමයි.
(3) බරණැස් සිටුවරයා තෙරුවන් සරණ යාමයි.
(4) තුන් බෑ ජටිලයන් බුදුසමය වැළඳ ගැනීමයි.
(5) ගවම්පතී කුලපුත්‍ර බුදුසමය වැළඳ ගැනීමයි.

**29.** "චරථ භික්ඛවෙ චාරිකං" යන දේශනාවෙහි අන්තර්ගත "මා එකෙන ද්වෙ අගමිත්ථ" යන ප්‍රකාශයෙහි අර්ථ දැක්වීමක් ලෙස සැලකිය හැක්කේ,

(1) සීමිත භෞතික සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමයි.
(2) සීමිත මානව සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමයි.
(3) මහජනයාට අවම බරක් දී ආහාර සපයා ගැනීමයි.
(4) සීමිත කාලයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමයි.
(5) සංචාරක ජීවිතයෙන් තොර පැවිදි ජීවිතයක් නොමැති බව තහවුරු කිරීමයි.

**30.** විවිධ අරමුණු හා පරමාර්ථ ඉලක්ක කර ගනිමින් භාරතයේදී පවත්වන ලද ත්‍රිවිධ ථෙරවාද සංගායනා අතුරෙන් තෙවන ධර්ම සංගීතියෙන් අපේක්ෂිත ප්‍රමුඛතම පරමාර්ථය වූයේ,

(1) ධර්ම විනය සුරක්ෂිත කිරීමට භාණකවරුන් පිරිසක් පත් කර ගැනීමයි.
(2) ධර්ම විනය ඒකරාශී කිරීමයි.
(3) නිකාය භේදය ඇතිවීම වැළැක්වීමයි.
(4) නව රට ධර්ම ප්‍රචාරය කිරීමයි.
(5) බුදුසසුන පිරිසිදු කොට සුරක්ෂිත කරලීමයි.

[පස්වැනි පිටුව බලන්න.

EXAMMOOD.LK EXAMMOOD.LK

**31.** දෙවන අශෝක නමින් ප්‍රකට කණිෂ්ක අධිරාජයා බුදුසමයේ උන්නතිය සඳහා කළ සුවිශේෂ මෙහෙවරක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) විභාෂා ග්‍රන්ථ රචනා කරවීමයි.
(2) භාණක පරපුරක් ඇති කරවීමයි.
(3) සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර ග්‍රන්ථය රචනා කරවීමයි.
(4) මහා ප්‍රඥා පාරමිතා ග්‍රන්ථය කරවීමයි.
(5) සාධනමාලා ග්‍රන්ථය රචනා කරවීමයි.

**32.** පැරණි භාරතීය කීර්තිමත් අධ්‍යාපන ආයතනයක් වූ වික්‍රමශිලා විශ්වවිද්‍යාලයේ විද්‍යා මණ්ඩප භාර ව සිටි ද්වාර පණ්ඩිතවරුන්ගේ ප්‍රමුඛ කාර්යභාරය වූයේ,
(1) ප්‍රවේශ පරීක්ෂණයකින් සිසුන් තෝරා ගැනීමයි.
(2) විෂය නිර්දේශ සැකසීමයි.
(3) පරිපාලන කටයුතු මෙහෙයවීමයි.
(4) විනය කටයුතු පවත්වා ගෙන යාමයි.
(5) ප්‍රවේශ දොරටුවල ආරක්ෂාව සඳහා කටයුතු කිරීමයි.

**33.** මහින්දාගමනයට පෙර ලංකාවේ ස්වදේශික ආගම් මෙන් ම සංක්‍රමණික ආගම් ද පැවැති බවට මූලාශ්‍රය සාධක හමු වේ. ලක්දිව ප්‍රචලිත ජෝතිය, ගිරි, කුම්භණ්ඩ යන පුද්ගලයන් ද සංක්‍රමණික ආගමික සම්ප්‍රදායයක් නියෝජනය කළ බව තහවුරු වී ඇත. එම ආගමික සම්ප්‍රදාය කුමක් ද?
(1) ආජීවක (2) පරිබ්‍රාජක (3) ජෛන
(4) බ්‍රාහ්මණ (5) අචේලක

**34.** ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වාදීමෙන් පසු මිහිඳු මහරහතන් වහන්සේ දෙවන දිනයේදී රජගෙදර කාන්තාවන්ට ..................... තේමා කරගෙන දහම් දෙසන ලදි.
(1) විමානවත්ථු හා පේතවත්ථු
(2) අග්ගික්ඛන්ධෝපම සූත්‍රය
(3) දේවදූත සූත්‍රය
(4) චූල්ලහත්ථිපදෝපම සූත්‍රය
(5) බාලපණ්ඩිත සූත්‍රය

**35.** "මහරජතුමනි, ශාසනය නම් පිහිටියේ ය. එහෙත් මුල්බැස ගත්තේ නැත." මෙම ප්‍රකාශයෙන් ශ්‍රී ලංකා භූමියෙහි බුදුසසුන ස්ථාවරත්වයට පත් කිරීමට මිහිඳු මාහිමියන් තුළ පැවැති අභිලාෂය ප්‍රකට වේ. එම අරමුණ සපුරා ගැනීමේ මූලික පියවර වශයෙන් උන්වහන්සේ විසින් යෝජනා කරන ලද්දේ,
(1) භික්ෂුණී ශාසනය පිහිටුවිය යුතු බවයි.
(2) යොදුනක් යොදුනක් පාසා චෛත්‍ය ඉදි කළ යුතු බවයි.
(3) ධර්ම සංගීතියක් පැවැත්විය යුතු බවයි.
(4) ස්වදේශිකයකු පැවිදි ව ධර්මවිනය උගෙන විනය දේශනා කළ යුතු බවයි.
(5) රට පුරා ධර්මය ව්‍යාප්ත කළ යුතු බවයි.

**36.** ප්‍රාග් බෞද්ධ ලංකාවේ පූජනීයත්වයට පත් විවිධ දෙවිවරුන් අතර දඩයමට අධිපති දෙවියා ලෙස වියතුන් විසින් .................. හඳුනාගෙන ඇත.
(1) ව්‍යාධදේව (2) පුරදේව
(3) කම්මාරදේව (4) වෙස්සවණදේව
(5) සුමනදේව

**37.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) සංඝමිත්තා රහත් මෙහෙණිය වැඩමවාගෙන ඒම පිණිස අරිට්ඨකුමරු ප්‍රධාන දූත පිරිසක් භාරතයට පිටත් කරන ලදි.
(2) දුටුගැමුණු රජතුමා විසින් කාලප්පාසාදය ඉදිකොට සඝුනට පූජා කරන ලදි.
(3) කුපික්කල මහා තිස්ස හිමියන් විසින් දුෂ්කර අවස්ථාවට පත් වලගම්බා රජු පෝෂණය කරන ලදි.
(4) දේවානම්පියතිස්ස රජතුමා විසින් මිහින්තලා පර්වතයේ ලෙන් හැටඅටක් ඉදිකොට සංඝයාට පූජා කරන ලදි.
(5) අභයගිරි විහාරයේ ප්‍රයෝජනය පිණිස ගජබා රජතුමා විසින් ගාමිණීතිස්ස ජලාශය තනවන ලදි.

**38.** "ලංකාවේ රජු බෞද්ධයකු පමණක් නොව බෝධිසත්ත්වයකු ද විය යුතු ය." යන ප්‍රකාශය ඇතුළත් වන සෙල්ලිපිය පිහිටුවන ලද්දේ .................................. රජතුමා විසිනි.
(1) නිශ්ශංකමල්ල (2) හතරවන මිහිඳු (3) දෙවන උදය
(4) පළමුවන විජයබාහු (5) මහා පරාක්‍රමබාහු

**39.** ලක්දිව බුදුසසුන පිහිටුවීමෙන් අනතුරුව ශාසනමාමක රජවරුන් විසින් බෞද්ධ ආරාම මෙන් ම පිරිවෙන් ද කරවා සසුනට පූජා කරන ලදි. එම පිරිවෙන් අතුරෙන් 'වියපත් අට ගණ' යන නමින් සම්භාවනාවට පත් මූලායතන අටක් පැවැතිණි. එම මූලායතන අටට අයත් **නො වන්නේ**,

(1) දක්ඛිණ මූලයයි.
(2) විල්ගම් මූලයයි.
(3) මහානෙත්තප්පාසාද මූලයයි.
(4) සේලන්තර මූලයයි.
(5) කාලප්පාසාද මූලයයි.

**40.** තාවකාලික පැවිද්ද ථායිලන්තයේ ජනප්‍රිය බෞද්ධ සංස්කෘතිකාංගයකි. සෑම පිරිමියකු ම ස්වකීය ජීවිත කාලය තුළ කිසියම් හෝ කාල පරිච්ඡේදයක් පැවිදි වී සිටීම ජීවිතයේ විවිධ අරමුණු ජය ගැනීමට හේතු වන බව ථායි ජනයාගේ විශ්වාසයයි. පහත සඳහන් වන්නේ තාවකාලික ථායි පැවිද්දේ අරමුණු පිළිබඳ ප්‍රකාශ සතරකි.

*A* - පැවිදි වී සිටීම විවාහයට සුදුසුකමකි.
*B* - රැකියා ලැබීමේ සුදුසුකමකි.
*C* - සුගතිගාමී වීමට කෙටි මගකි.
*D* - බෝධිසත්ත්වයකු වීමට අත්‍යවශ්‍ය වූවකි.

ඉහත ප්‍රකාශ අතුරෙන් ථායි පැවිද්දෙන් අපේක්ෂිත අරමුණු දැක්වීමට වඩාත් ගැළපෙන ප්‍රකාශ දෙක වන්නේ,

(1) *A* සහ *B* ය. (2) *A* සහ *C* ය. (3) *A* සහ *D* ය. (4) *B* සහ *C* ය. (5) *B* සහ *D* ය.

**41.** ථායිලන්ත බුදුසමයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **වැරදි** ප්‍රකාශය කුමක් ද?

(1) ක්‍රි.පූ. 329 දී නකොම් පඨොම් නගරය ආශ්‍රිත ව ථෙරවාදී බුදුසමය ව්‍යාප්ත විය.
(2) ක්‍රි.ව. 700 දී පලම්භාන් රජුගේ අනුග්‍රහයෙන් මහායාන බුදුසමය ව්‍යාප්ත විය.
(3) ක්‍රි.ව. 11 වන සියවසේදී බුරුම පාලක අනෞරථ රජුගේ අනුග්‍රහයෙන් බුද්ධ ධර්මය ව්‍යාප්ත විය.
(4) ක්‍රි.ව. 1361 දී ශ්‍රී සූර්යවංශ රාම මහාධාර්මික රජුගේ අනුග්‍රහයෙන් ලාංකේය භික්ෂූන් මගින් බුද්ධ ධර්මය ව්‍යාප්ත විය.
(5) ක්‍රි.ව. 7 වන සියවසේදී ද්වාරවතී රාජ්‍යයෙන් චීනයට බුදුසමය ව්‍යාප්ත විය.

**42.** චීනය හා ශ්‍රී ලංකාව අතර ඈත අතීතයේ පටන් ම ආගමික හා සංස්කෘතික සම්බන්ධතා පැවතිණි. එම සම්බන්ධතා තහවුරු කිරීමෙහි ලා ශ්‍රී ලාංකිකයන්ගෙන් ද නොමඳ දායකත්වයක් ලැබුණි. ඒ අනුව චීන බුදුසමයේ ප්‍රගමනයට ශ්‍රී ලාංකේය කාන්තාවන්ගෙන් සිදු වූ මෙහෙය ප්‍රකට වන ප්‍රමුඛ නිදසුනක් වන්නේ,

(1) බෞද්ධ සංකේත හා පූජා වස්තූන් ලාංකේය කාන්තාවන් මගින් ලැබීමයි.
(2) බෞද්ධ වෙහෙර විහාර ගොඩනැංවීමේදී ලාංකේය කාන්තාවන්ගේ දායකත්වය නො මඳව ලැබීමයි.
(3) ත්‍රිපිටක ග්‍රන්ථ පරිවර්තනයේදී ලාංකේය කාන්තාවන්ගේ දායකත්වය ලැබීමයි.
(4) භික්ෂුණී ශාසනය පිහිටුවීමේදී ලාංකේය කාන්තාවන්ගේ දායකත්වය ලැබීමයි.
(5) බුදුදහම හඳුන්වා දීමේදී ලාංකේය කාන්තාවන් පෙරමුණ ගැනීමයි.

**43.** ජපානයට බුදුසමය පැමිණීමෙන් පසු එරට සෑම ක්ෂේත්‍රයක් කෙරෙහි ම බුදුසමයේ ආභාසය ලැබුණි. ඒ අතර බුද්ධ ප්‍රතිමා නිර්මාණයට එරට කලා ක්ෂේත්‍රයේ හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. ජපන් බුද්ධ ප්‍රතිමා අතර භෛෂජ්‍යගුරු, වෛරෝචන හා නරාදයිබුත්සු ප්‍රතිමාවලට සුවිශේෂ තැනක් හිමි වේ. මේ අතුරෙන් භෛෂජ්‍යගුරු බුද්ධ ප්‍රතිමාව පිහිටා ඇත්තේ,

(1) තෝදයිජි විහාරයේ ය.
(2) හෝර්යුජි විහාරයේ ය.
(3) හෝකොජි විහාරයේ ය.
(4) යකුෂිජි විහාරයේ ය.
(5) මියොසින්ජි විහාරයේ ය.

**44.** ක්‍රි.ව. 710 දී ගෙම්මෙයෝ අධිරාජිණිය විසින් නරා ප්‍රදේශය අගනුවර කර ගැනීමෙන් අනතුරු ව ජපානයේ බුදුසමය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. මෙකල ජපානය තුළ බෞද්ධ සම්ප්‍රදායයන් හයක් ම ව්‍යාප්ත ව පැවැති බව ඓතිහාසික තොරතුරුවලින් පැහැදිලි වේ. මේ අතුරෙන් චීනය පදනම් කොටගෙන ව්‍යාප්ත ව පැවැති බෞද්ධ සම්ප්‍රදාය වන්නේ,

(1) කුෂ සම්ප්‍රදායයි.
(2) ජෝජිත්සු සම්ප්‍රදායයි.
(3) හොස්සෝ සම්ප්‍රදායයි.
(4) සන්රොන් සම්ප්‍රදායයි.
(5) රිත්සු සම්ප්‍රදායයි.

**45.** පුරාවිද්‍යාත්මක සාධක අනුව බුදුරදුන්ගේ රුව මානවාකාරයෙන් නිර්මාණය කරන ලද්දේ ක්‍රිස්තු පූර්ව පළමුවැනි සියවසේ හෝ ක්‍රිස්තුවර්ෂ පළමුවැනි සියවසේ දී ය. බුදුරුව පළමු ව ගන්ධාර දේශයේ නිර්මාණය වූ බවට ද මථුරා දේශයේ නිර්මාණය වූ බවට ද විද්වත් මත පවතී. ඒ අනුව පළමු ව බුදුරුව මථුරාවේදී නිර්මාණය වූ බව ප්‍රකාශ කරන ලද්දේ,

(1) ආනන්ද කුමාරස්වාමි මහතා විසිනි.
(2) පර්සි බ්‍රවුන් මහතා විසිනි.
(3) ෆුෂේ මහතා විසිනි.
(4) පරණවිතාන මහතා විසිනි.
(5) වින්සන්ට් ස්මිත් මහතා විසිනි.

[හත්වැනි පිටුව බලන්න.

EXAMMOOD.LK

**46.** ගන්ධාර හා මථුරා බුද්ධ ප්‍රතිමාවල අනන්‍යතා ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

*A* - ස්වාභාවික හිසකෙස්
*B* - ශාක්‍යසිංහ ලීලාව
*C* - කැරලි ගැසුණු ශෛලීගත හිසකෙස්
*D* - අඩවන් දෙනෙත්

ඉහත ප්‍රකාශ අතුරෙන් මථුරා බුද්ධ ප්‍රතිමාවේ අනන්‍යතා ලක්ෂණ **දෙකක්** ඇතුළත් වරණය තෝරන්න.

(1) *A* සහ *B* (2) *A* සහ *C* (3) *A* සහ *D* (4) *B* සහ *C* (5) *B* සහ *D*

**47.** ප්‍රතිමා කලාවට අනුව ආසන යනු හිඳ ගැනීමට භාවිත ආධාරකය නොව හිඳ ගැනීමේදී දෙපා තබා ගන්නා විලාසයයි. ඒ අනුව ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමා අතර භද්‍රාසනය නිරූපණය වන ප්‍රතිමාවක් ලෙස හැඳිනගෙන ඇත්තේ,

(1) තොලුවිල ප්‍රතිමාවයි.
(2) ගල් විහාරයේ විද්‍යාධර ගුහාවේ ප්‍රතිමාවයි.
(3) මහමෙව්නාවේ සමාධි ප්‍රතිමාවයි.
(4) අම්බලන්තොට රිදියගම විහාර භූමියෙන් සොයාගත් ප්‍රතිමාවයි.
(5) පන්කුලිය අශෝකාරාමයේ ප්‍රතිමාවයි.

**48.** පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍ය අනුව ලක්දිව ප්‍රථම ස්තූපය ලෙස සැලකෙන ථූපාරාමයේ නිදන් කොට ඇතැයි සැලකෙන්නේ බුදුරජාණන් වහන්සේගේ,

(1) වම් අකු ධාතුවයි. (2) දකුණු අකු ධාතුවයි.
(3) ග්‍රීවා ධාතුවයි. (4) ලලාට ධාතුවයි.
(5) පටී ධාතුවයි.

**49.** සිංහල සාහිත්‍යයේ විවිධ ක්ෂේත්‍රවලට බෞද්ධ ඉගැන්වීම්වලින් ලැබී ඇති ආලෝකය අතිමහත් ය. ලක්දිව ගීත සාහිත්‍යය ද බෞද්ධ ආභාසයෙන් පෝෂණය වී ඇති බවට කොතෙකුත් නිදසුන් ගෙනහැර දැක්විය හැකි ය. අසිරිමත් බුදුසිරිත, බුද්ධ ධර්මය, ශාසන ඉතිහාසය මෙන් ම ඇතැම්විට සමාජ විචාරය ආදි ක්ෂේත්‍ර ද මෙම බෞද්ධ ගීතවලට තේමා සපයා ඇත. ඒ අනුව උසස් පහත් වශයෙන් සමාජ වර්ගීකරණය කිරීමේ හරසුන් බව ප්‍රකට කරන ගී නිර්මාණයක් ලෙස සැලකිය හැක්කේ පහත කුමන ගීතය ද?

(1) "සොර දෙටුවෙක් කස තැලුම් කකා "......
(2) "අඩුකුලේ කියාලා අසරණයා"......
(3) "කවාලා විළඳ ජාතී ඇති කළත් රන් කුඩුවේ"......
(4) "සන්නාලියනේ සන්නාලියනේ...... කාටද ඇඳුම වියන්නේ "......
(5) "සංසාරේ බවේ දුකා ශ්‍රී සැසී දෙසූ මෙසේ "......

**50.** දඹදෙණි හා කෝට්ටේ යුගවල රචිත බොහෝ ගද්‍ය-පද්‍ය නිර්මාණ බුදුගුණ වර්ණනා කිරීම අරමුණු කොට රචිත බව පැහැදිලි වේ. ඒ අනුව දඹදෙණි යුගයේ රචිත පූජාවලියෙන් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේගේ කුමන ගුණය ද?

(1) සම්මා සම්බුද්ධ ගුණය (2) පුරිසදම්ම සාරථී ගුණය
(3) අරහං ගුණය. (4) භගවා ගුණය.
(5) සත්ථාදේවමනුස්සානං ගුණය.

* * *

EXAMMOOD.LK
EXAMMOOD.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

45 S II

2019.08.06 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ. (**I කොටසේ** එක් අනු ප්‍රශ්නයකට ලකුණු **04** බැගින් ද **II කොටසේ** එක් අනු ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.)

## I කොටස

**1.** (i) වානප්‍රස්ථ ආශ්‍රමයට අයත් කාර්යයන් කෙටියෙන් දක්වන්න.
(ii) මානව සංහතියේ ඒකත්වය තහවුරු කිරීමෙහි ලා බුදුසමය ඉදිරිපත් කරන ජීවවිද්‍යාත්මක සාධක සැකෙවින් පෙන්වා දෙන්න.
(iii) පූරණකස්සප ශාස්තෘවරයාගේ අකිරියවාදය ගෙනහැර දක්වන්න.
(iv) අකිරියවාදය පිළිබඳ බුදුසමයේ ආකල්පය සංක්ෂේපයෙන් ඉදිරිපත් කරන්න.
(v) බුද්ධකාලීන භාරතයේ කෘෂිකාර්මික ජීවන රටාවක් පැවැති බවට සාධක **හතරක්** දක්වන්න.

**2.** (i) ලෝකවිදූ බුදුගුණය පිළිබඳ කෙටි විවරණයක් සපයන්න.
(ii) ප්‍රශ්න විසඳීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් භාවිත චතුර්විධ ක්‍රමවේදය කෙටියෙන් හඳුන්වන්න.
(iii) තාදී බුදුගුණයෙන් ශ්‍රාවකයාට ලැබිය හැකි ආදර්ශයන් සංක්ෂිප්ත ව ඉදිරිපත් කරන්න.
(iv) බුදුරජාණන් වහන්සේ ආගමික සහනශීලීතාව ප්‍රකට කළ අවස්ථා **දෙකක්** විස්තර කරන්න
(v) මහාප්‍රජාපතී ගෝතමිය සතුව පැවැති ගුණාංග **පහක්** ගෙනහැර දක්වන්න.

**3.** (i) "උට්ඨානවතෝ සතිමතො........." යන ගාථාව සම්පූර්ණ කරන්න.
(ii) එම ගාථාවේ අර්ථය නිවැරදි ව ලියන්න.
(iii) පුද්ගල ජීවිතයේ සාර්ථකත්වය උදෙසා එම ඉගැන්වීම ආදර්ශ කොට ගත හැකි අයුරු කෙටියෙන් පහදන්න.
(iv) "සුභාසිතා ච යා වාචා" යන්නට කෙටි විවරණයක් සපයන්න.
(v) අලසබවෙහි ආදීනව පිළිබඳ සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන ඉගැන්වීම් පෙන්වා දෙන්න.

## II කොටස

**4.** (i) රටක ආර්ථික සමෘද්ධිය විෂයයෙහි ලා දේශපාලන මැදිහත්වීම කෙසේ සිදුවිය යුතු දැ'යි බෞද්ධ දේශපාලන මූලධර්ම ඇසුරෙන් විස්තර කරන්න.
(ii) පුද්ගල ස්වාමිත්වය පිළිබඳ බුදුසමයේ ආකල්පය වෙනත් සමකාලීන ආගමික ඉගැන්වීම්වලින් වෙනස්වන අයුරු පැහැදිලි කරන්න.

[ දෙවැනි පිටුව බලන්න.

EXAMMOOD.LK

**5.** (i) නූතන සමාජය මුහුණ දෙන ප්‍රධාන සමාජ ගැටලු අවම කර ගැනීමට පඤ්චශීල ප්‍රතිපදාවෙන් ලැබිය හැකි පිටිවහල පැහැදිලි කරන්න.

(ii) ගෘහස්ථ ජීවිතයේ සාර්ථකත්වය සඳහා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ මූලධර්ම අදාළ කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

**6.** (i) භික්ෂු සමාජයේ පාරිශුද්ධිය පිණිස ධර්ම සංගායනාවලින් ලැබුණු පිටිවහල නිදසුන් මගින් පැහැදිලි කරන්න.

(ii) කණිෂ්ක රජු විසින් සිදු කරන ලද ශාසනික මෙහෙය ඓතිහාසික සාධක ඇසුරෙන් ඇගයීමට ලක් කරන්න.

**7.** (i) ථෙරවාද බුදුසමයේ සුරක්ෂිතතාව පිණිස මහාවිහාරීය භික්ෂූන් විසින් සිදු කරන ලද මෙහෙවර විස්තර කරන්න.

(ii) මියන්මාරයට බුදුසමය හඳුන්වාදීමේ ඓතිහාසික පසුබිම කෙටියෙන් ගෙනහැර දක්වා එරට ජනජීවිතය බුදුසමයෙන් පෝෂණය වූ ආකාරය පැහැදිලි කරන්න.

**8.** (i) ශ්‍රී ලාංකේය ස්තූප නිර්මාණයේ දී භාරතීය ස්තූප කලාවේ මූලික ආකෘතිය නවීකරණය වූ ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න.

(ii) බෞද්ධ සාරධර්ම ජන විඥානයට සම්ප්‍රේෂණය කිරීමෙහි ලා කෝට්ටේ යුගයේ සිංහල පද්‍ය සාහිත්‍ය රචකයන් විසින් ගන්නා ලද උත්සාහය ලෝවැඩ සඟරාව ඇසුරෙන් ඇගයීමට ලක් කරන්න.

* * *

EXAMMOOD.LK
EXAMMOOD.LK